Page 2 August 2010.qxd 19/08/2010 22:29 Page 1





# ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

*Phone* : 02074289388
*Fax* : 08719005163
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

## ශ්‍රීලංකාවේ ක්‍රියාත්මක වන මර්වින්ගේ නීතිය

මහාමාර්ග නියෝජ්‍ය ඇමති මර්වින් සිල්වා ගිය සතියේ දිනක සිය මන්ත්‍රී ආසනයට අයත් හුණුපිටිය පෙදෙසේ දී සමෘධි නිලධාරියෙකු අල්ලා අඹ ගසකට තබා කඹයකින් බැන්දේය. ඒ එම නිලධාරියා පළාතේ ඩෙංගු උවදුර පිළිබඳව සාකච්ඡාකරන්නට කැඳවූ රැස්වීමකට නොපැමිණි නිසා දඬුවමක් වශයෙනි. මර්වින් මන්ත්‍රීවරයෙකු හා උප ඇමතිවරයෙකු බව සැබෑ නමුත් තවත් කෙනෙකුට ශාරීරිකව හෝ මානසිකව දඬුවම් කරන්නට ඔහුට කිසිදු අයිතියක් නැත. එහෙත් මර්වින් හිතන්නේ රාජ්‍ය බලයට මුවාවී තමා කැමති දෙයක් ශ්‍රීලංකාව තුළ හොඳින් හෝ නරකින් කළ හැකි බවය. ඒ මානසිකත්වයට තව හේතුවක්ද ඇත. එනම් මෙතෙක් ඔහු කරඇති කිසිදු අශෝබන ක්‍රියාවකට ජනාධිපතිවරයා හෝ වර්තමාන රජය හෝ කිසිදු විරෝධතාවක් නොපෑමයි. වෙනත් අන්දමින් කිවහොත් ඒ ක්‍රියා අනුමත කිරීමයි.

මර්වින්ගේ මෙම අමන ක්‍රියාව සිහි බුද්ධිය ඇති කවුරුත් හෙළාදකිති. ගමේ බසින් කියනවා නම් මර්වින් සිල්වා මෙවැනි 'පඩත්තල' වැඩ කරන්නේ අළුතක සිට නොවේ. ඔහු කුමන හෝ අවාසනාවකින් ලංකා දේශපාලනය තුළට සිය අණ්ඩ දැමූ දා සිට ය. ඔහුගේ වාචාල කටත්, තෝ, අරෑ, මූ, ගොනා, බූරුවා, යකෝ, කාලකණ්ණියා ආදි අනෙක් මන්ත්‍රීවරුන් අමතන්නට ඔහු යොදන අසික්කිත වාග් මාලාවත් ජනතාවට මතකය. එහෙත් මිනිස්කමට නිගා දෙවන මේ අන්දමේ ගල් මුසල ක්‍රියාවක් ආත්ම ගරුත්වයක් ඇතුව ජීවත්වන දරුපවුල් කාරයෙකුට පමුණුවාවියයි කිසිවෙකුත් එතෙක් සිතන්නට නැත.

ශ්‍රීලංකාව ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍යයන්හි පාර්ලිමේන්තුව රටට නීති සාදන ව්‍යවස්ථාදායකයයි. ඒ නීති ක්‍රියාවට නැගීමේ අයිතිය ඇත්තේ ඒ රටේ අධිකරණයට පමණ ය. ඒ නිලධාරියා වරදක් කළේ නම් ඔහු සේවයෙන් අස්කර දමන්නට රැකියා ආයතනයට හැකිය. ඔහු ගස්බඳින්නට බැරිය. තමා පාර්ලිමේන්තු යන නිසා දඬුවම් දෙන්නටත් තමාට පුළුවන් යයි මර්වින් සිල්වා සිතුවාදැයි අපි නොදනිමු. මේ සියළු ක්‍රියාදාමයෙන් නින්දාවට ලක්වන්නේ අපේ රටය. මිනිස් අයිතිවාසිකම් කඩකළායයි කියාත්, මාධ්‍යවේදීන්ට මැරප්‍රහාර එල්ලකරනවායයි කියාත්, පුවත්පත් නිදහසක් ලංකාව තුළ නැතැයි කියාත් දැනටම ලෝක අපවාද කෝටියක් වර්තමාන ලංකා රජයට එල්ල වී ඇත. ඒ චෝදනා තවත් උග්‍රඅතට හරවන්නේ මර්වින් සිල්වා ය. මේ සියල්ලේ දී කාගේත් ඇඟිල්ල කෙලින්ම එල්ලවන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට ය. තම රජයේ සිටින මීහරකා මෙල්ල කරන්නට ඔහුට බැරිවුණේ ඇයිදැයි දහසක් දෙනා අසන ප්‍රශ්නයයි.

හෙට අනිද්දාම මර්වින් තවත් අහිංසකයෙකුට පහර දී මරාදමන්නටද පුළුවන. එදාටත් මේ රජය ගොළුවන් බිහිරන්සේ අහක බලාගන්නවා ඇත. මර්වින් සිල්වා සමග රජය ශ්‍රීලංකා රට ගෙනයන්නේ ඉදිරිගමනක නොව පාතාලයක් දෙසට බව දැන් අපට පෙනේ.



# The resplendent pageant of the resplendent island
# නුවර අසම ඇසළ පෙරහැර

## Possible outcome of the pageant: the rainmaker
## නියඟයකදී නිසැකවම වැසිවස්සන දළදා පෙරහැර

In 1829, on the advice of the Kandyan chiefs, Kandy Esala Perahera pageant was held by British colonial governor Sir Edward Barnes to end the severe drought in the island. The pageant resulted in heavy downpour. The flood water spilled over the Kandy Lake & submerged the low-lying areas, making the roads impassable. In the "Dalada Sirita", a Sinhalese treatise on the Tooth Relic, it is said: "When there is no rain, make offerings to the Tooth Relic in this manner"

Origin of the ancient pageant

The Sinhalese chronicles suggest the annual pageant was held in the 3rd century BC in the hills as a rainmaking event: pay tribute for the harvest & prey to the gods for rain in time for the next crop. However the general belief is that the pageant commenced with the arrival of the Sacred Tooth Relic in Sri Lanka in the fourth century AD, during the reign of King Kirti Sri Meghawanna (304-331 AD). When King Guhasiva of Kalinga (Orissa) faced defeat, the Tooth Relic was hidden in his daughter Hemamala's hair & she was spirited away to Lanka. She was accompanied by Prince Dhanta. The arrival of Holy Tooth Relic with the Orissan princess caused a sensation in the populace & the king rising to the occasion decreed that the relic be carried in procession through the city once a year. Prince Dhanta & Princess Hemamala settled down at Keerawella (Manikkadawara) an important ancient city of Lanka. It seems pre Buddhist tradition of rainmaking festival merged with the newly created procession of Buddhist Lanka. The Tooth Relic becoming palladium of regal authority, the pageant quickly developed into the most prominent religious event. The famous Chinese Buddhist pilgrim traveler Fa Hsien, visiting Anuradhapura in 399 AD, described the splendid festival, with processions of jewel-encrusted elephants.



**1829** දී ශ්‍රීලංකාව පුරා දැඩි නියඟයක් පැවතුණි. ගංගා ඇළ දොළ සිඳී ගොස් ගහකොළ සියල්ල වියළී ගියේය. එකල ඉංග්‍රීසි ආණ්ඩුකාරයාව සිටි සර් එඩ්වඩ් බාන්ස් හමුවූ මහනුවර රදළ ප්‍රධානීන් ඔහුට දන්වා සිටියේ එවකට නවතා දමා තිබූ මහනුවර ඇසළ පෙරහැර දන්තධාතූන් වහන්සේ එළියට වඩම්මවා, වීදි සංචාරය කරමින් පැවැත්තුව හොත් නිසැකවම වර්ෂාව ඇතිවන බවයි. ඒ කී ප්‍රකාර ආණ්ඩුකාරවරයා දළදා වහන්සේ මාළිගයෙන් පිටතට වඩම්මවා පෙරහැර පැවැත්වීය.

නොබෝ වේලාවකින්ම වහින්නට පටන්ගත්තේය. ඒ වර්ෂාව ඉතා අධික ලෙස වැටුණු අතර ඉන් නුවර වැව ඉතිරී පිටාර ගලන්නට වූ බව කියති. එම හාස්කම දුටු ඉංග්‍රීසි ප්‍රධානීහු ඉන්පසු වසරක් පාසා දළදා පෙරහැර පවත්වන්නට සිංහළයින්ට ඉඩ දුන්හ.

පුරාණ ලියකියවිලි වල සඳහන්වන්නේ ක්‍රි පූ **3** වන සියවසේ සිට කන්ද උඩරට පෙදෙස් වල වැස්ස පතා වැස්ස වළාහක දෙවියන්ට පුදපූජා වශයෙන් පෙරහැරක් පැවැත්වුණු බවයි.

එහෙත් ජනමතයට අනුව දළදා පෙරහැර ආරම්භවූයේ කළිඟු රටේ රජ කළ ගුහසීව රජු තම රාජ්‍යය සතුරු රජෙකුට පැරදුණු විට ආරක්ෂාව පිණිස තම රාජ්‍යය සතුව තිබූ දළදාව ශ්‍රීලංකාවට එවූ පසුව බවයි. එය මෙහි ගෙන ආවේ දන්ත කුමරු සහ හේමමාලා කුමරියයි. හේමමාලා දන්ත ධාතුව තම කොණ්ඩයේ සඟවාගෙන තිබිණ. එකල එනම් **4** වන සියවසේ ලංකාවේ රජ කළේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමාය. දන්ත ධාතූන් වහන්සේ අතිශය සැදැහැ සිතින් බාරගත් රජතුමා එය නිසි කරඬුවක තැන්පත් කොට විසල් පෙරහැ රකින් වාර්ෂිකව එයට පුදපූජා පැවැත්විය යුතු බව නියම කළේය. වැස්ස වස්සවන පෙරහැර ලංකාවේ බුදුසමයේ ව්‍යාප්තියත් සමග දළදාපෙරහැර බවට පත්විය. එසේම එදා සිට දන්තධාතුව සිංහළ රාජ්‍යයේ හිමිකම පැවරෙන ලක්ෂණයක්ද විය. ඉංග්‍රීසීන් කන්ද උඩරට අල්ලාගන්නට මූලික හේතුවද දළදාව සතු අයට ජනතා ප්‍රසාදය ද නිතැතින් හිමිවීම ය.

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

**මාතා පීතෘ කෘතාභ්‍යාසො - ගුණිතාමෙති බාලක:**
**න ගර්භච්‍යුති මාත්‍රෙණ - පුත්‍රො භවති පණ්ඩිත:**

***අර්ථය*** : *පුතා මවගේ ගැබෙන් බිහි වූ පමණින් උගතෙක් ගුණවතෙක් නොවේ. මව හා පියා විසින් කරන ලද අභ්‍යාසයෙන් ඔහු ගුණවත් බවට පැමිණේ.*

දෙමව්පියන්ගේ එකම සම්පත හෙවත් වස්තුව තම දූ පුතුන්ය. දූදරුවනටද තමන්ගේ වටිනාම සම්පත ආදර ණීය දෙමාපියන් ය. මේ දූදරු මාපිය සම්බන්ධතාව සනා තනික ධර්මයකි. එය මනුෂ්‍ය ප්‍රජාව අතර පමණක් නොව සැම සත්ව කොට්ඨාශයකටම සාධාරණය වූ ධර්මතාවකි.

දෙමාපියන් විසින් තම දූදරුවන්ට කුඩා කාලයේ දක්වනු ලබන්නාවූ ආදරය, කරුණාව, දරු සෙනෙහස මෙන්ම පෝෂණය හා රැකවරණය නිසාම දරුවන් කායික හා මානසික සංවර්ධනයකින් යුතු සමාජයට වැඩදායක යහපත් පුරවැසියන් බවට පත්වන බව අපි දනිමු. නමුත් ඉන් ඔබ්බට ගිය තවත් පුළුල් කාර්‍යභාරයක් දෙමාපියන් තම දූ පුතුන් වෙනුවෙන් ඉටු කළ යුතුව පවතිනවා. ඒ තම දරුවන් සමාජ විරෝධී අපචාරී පුද්ගලයන් වශයෙන් නොව සමාජ හිතකාමී මිනිස් ගුණධර්ම වලින් අනූනවූ උතුම් පුද්ගලයන් හැටියට තැනීමයි.

මෙම පද්‍යයේ සඳහන් ආකාරයට දරුවෙකු මව්කුසේ උපන් පමණින්ම ඔහු හෝ ඇය ගුණවත් නැණවත් කෙනෙකු වන්නේ නැත. ඒ සඳහා විශාල කාර්‍යභාරයක් දෙමාපියන් කළ යුතුව තිබේ. එනම් මව හෝ පියා විසින් එම දරුවන් අභ්‍යාසයෙන් හෙවත් පුහුණුවෙන් නිසි ආකාරයට හික්මවනු ලැබීමයි. නිසි ආකාරයට ගුණ ධර්මයන්හි පිහිටුවීමයි. එමෙන්ම අධ්‍යාපනයේ හා ශිල්ප ශාස්ත්‍රාදියෙහි ප්‍රගුණකරවීමයි. එසේ නොමැතිව මව පියා කොතරම් ගුණ නැණ දෙකින් යුතු වූවත් ඉන් දරුවන්ට කිසිදු වැඩක් නොවේ.

දෙමාපියන් වැරදි මග යමින් දරුවන් නිවැරදි මග යැවීමට උපදෙස් දීම අද හැම සමාජයකම දක්නට ලැබෙන දෙයකි. දරුවන් ඇති දෙමාපියන් හැමවිටම දරුවන්ට ආදර්ශමත් ලෙස හැසිරිය යුතු ය. මක්නිසාද ළමා කාලයේ බොහෝ විට ළමයින්ගේ සිරිත අනුකරණය කිරීම වන බැවිනි. දරුවෝ විශේෂයෙන් ගෙදරදී තම දෙමාපියන් අනුකරණය කිරීමට නියත වශයෙන්ම පෙළඹෙන්නාහ.


දෙමාපියන් මත්පැන් පානය කිරීම, දුම්පානය, නිතර අඬදබර ඇතිකර ගැනීම ආදී නොයෙක් දේ තැන නොතැන නොබලා දරුවන් ඉදිරියේ ම කරමින් දරුවන් ඉන් වළකාලීමට ඔවුන්ට අවවාද අනුශාසනා කිරීම නිෂ්ඵල ය. . ඕවා දෙනු පරහට තමා සම්මතයෙහි පිහිටා සිට. යන කියමනට අනුව සැම කෙනෙකුම අනුනට උපදෙස් දීමට පෙර තමා ඒවායින් වැළකී සිටිය යුතු ය.

අද හැමදෙනාම පාහේ ගත කරන්නේ කාර්‍යබහුල ජීවිත ය. විශේෂයෙන් බටහිර රටවලට එය පොදු ය. නමුත් ඒ නිසාම දූදරුවන් ගැන නොතැකීම නුවණට හුරු නැත. අශ්වයා පැන ගියාට පසු ස්තාලය වසා වැඩක් ඇද්ද? දරුවන් නොමග ගියවිට දරුවන්ට හෝ සමාජයට දොස් පවරා තමන්ට නිර්දෝෂී විය නොහැකියි. එයට හේතුව ඉන් විශාල කොටසක් තමන්ට අයිති වන නිසයි.

එමෙන්ම යොවුන් වියට පිවිසෙන දරුවන්ද ඉතා කල්පනාකාරීව සමාජයේ ජීවත්විය යුතු ය. සමාජය හොඳින් වටහාගත යුතු ය. විශේෂයෙන් මිතුරන් ඇසුරු කිරීමේදී වඩාත් කල්පනාකාරීවිය යුතුය. හොඳ නරක දෙපැත්තටම ඉතා ඉක්මණින් පෙරළීමට ඇසුරු කරන්නන් බලපාන බැවිනි. අසත්පුරුෂ සේවනය කෙනෙකුගේ විනාශය ළඟාකර ගැනීමකි.

මේනිසා දරුවන් ගැන දෙමව්පියන් වඩාත් සැලකිලිමත් විය යුතුවාක් සේම දරුවන්ද බුද්ධිමත්ව ක්‍රියාකිරීමෙන් තම ජීවි තය තමන්ටද සමාජයටද වැඩදායී ලෙසට සකස්කරගත යුතු ය.

♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති
**පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි**
ලන්ඩන් බෞද්ධ විහාරය
**London Buddhist Viharaya**
**The Avenue**
**London W4 1UD UK**




**NORMA & Co**
**Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

*Colombo Office*
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632